# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2025 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයට ලකුණු 25ක් වෙන් කර ඇති අතර එය බහුවරණ (OTQ) ප්‍රශ්න 10 කින් සහ කෙටි පිළිතුරු ලිවීම සඳහා උප ප්‍රශ්න 5 කින් සමන්විත විය. පවතින විෂය නිර්දේශය යටතේ උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ආවරණය වන පරිදි දැනුම පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණු අතර සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වූයේ අයදුම්කරුවන් කිහිප දෙනෙකුට පමණි.

උත්තරවල පහත පොදු දුර්වලතා සහ වැරදි නිරීක්ෂණය කරන ලදී:

1.1 මෙම ප්‍රශ්නය මගින් තොග තක්සේරු කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලද අතර බොහොමයක් අයදුම්කරුවන් රුපියල් මිලියන 4.8 ක් ලෙස නිවැරදිව පිළිතුර තෝරා තිබුණි. විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් නොමැතිකම නිසා සමහර අයදුම්කරුවන්ට නිවැරදි පිළිතුර හඳුනා ගැනීමට නොහැකි වූ බව සඳහන් කළ යුතුය.

1.2 මෙම ප්‍රශ්නය මගින් පිරිවැය ගිණුම්කරණය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පිරිවැය ගිණුම්කරණයට අදාළ ව ලබා දී ඇති ප්‍රකාශය හඳුනාගෙන නිවැරදිව පිළිතුර තෝරාගෙන තිබු අතර මූලික පිරිවැය ගිණුම්කරණ මූලධර්ම පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම නිසා නිවැරදි උත්තරය ලබා දීමට නොහැකි වූයේ සුළු පිරිසකට පමණි.

1.3 මෙම ප්‍රශ්නය මගින් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

1.4 මෙම ප්‍රශ්නයෙන් අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරා ගැනීමට අපේක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලබා දී ඇති අතර, ඇතැම් අයදුම්කරුවන් වෙන් කළ ලකුණු ලබා ගැනීමට අසමත්ව තිබුණි.

1.5 මෙම ප්‍රශ්නය මගින් ගිණුම්කරණ සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කළ අතර, අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලද්දේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදි කුලී ආදායම ගණනය කිරීමයි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවකට අදාළ වර්ෂය සඳහා නිවැරදි කුලී ආදායම ගණනය කිරීමට නොහැකි විය.

1.6 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 ට අනුකූලව වාර්තා කරන කාල පරිච්ඡේදයෙන් පසු නොගලපන සිදුවීම් හඳුනා ගැනීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් ලාභාංශ යෝජනා, ආයෝජනවල වෙළඳපල වටිනාකම අඩුවීම යනාදිය ලබා දෙමින් සම්පූර්ණ ලකුණු ලබා ගත් අතර අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිවැරදිව පිළිතුරු දීමට අපොහොසත් විය.

1.7 ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) සූත්‍රයේ උපකල්පන තුනක් සඳහන් කිරීමට අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උත්තර දී ලබා තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් වරදවා EOQ සූත්‍රය පමණක් ලියා තිබුණි.

1.8 X සහ Y ගේ කැපකළ අනුපාතය ගණනය කිරීම සඳහා මෙය පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් සාර්ථකව නිවැරදි අනුපාතය ලබා දී තිබුණු අතර, අයදුම්කරුවන් කිහිප දෙනෙකුට දුර්වල අවබෝධය හා දුර්වල ගණිත කුසලතා නිසා කැපකළ අනුපාතය ගණනය කිරීමට නොහැකි විය.

**1.9** මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්, ලබා දී ඇති සිදුවීම මත පදනම්ව පෞද්ගලික සමාගමක් විසින් ගෙවිය යුතු ශුද්ධ වැටුප ගණනය කිරීම අවශ්‍ය විය. මෙය මූලික හා සරල ගිණුම්කරණ ගණනය කිරීමක් වූ බැවින් බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. කෙසේවෙතත්, අයදුම්කරුවන් ඉතා සුළු ප්‍රමාණයකට සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය වැරදි ලෙස ගණනය කිරීම හේතුවෙන් ගෙවිය යුතු ශුද්ධ වැටුප ගණනය කිරීමට නොහැකි විය.

**1.10** නිෂ්පාදන ආයතනයක යම් සේවකයෙකුගේ මුළු ඉපැයීම ගණනය කිරීමට මෙම ප්‍රශ්නයෙන් විමසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මුළු ඉපැයීම ගණනය කර තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් සපයන ලද තොරතුරු අවබෝධ කර නොගැනීම නිසා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය මගින් කේවලස්වාමී ව්‍යාපාරයක 2023 අප්‍රේල් මස 01 වන දින ට ප්‍රාග්ධන (ස්කන්ධ) ශේෂය සහ 2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය ගණනය කිරීම පරීක්ෂා කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් ප්‍රාග්ධන ශේෂය නිසි ලෙස ගණනය කර නොතිබූ අතර පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) මුදල් පොත පිළියෙළ කිරීම සඳහා සැලකිය යුතු කාලයක් වැය කර ඇති බව සඳහන් කළ යුතුය.

(2) රු.9,000,000/-ක් වූ මෝටර් රථ වල අගය (ක්ෂය වීමෙන් පසු) ප්‍රාග්ධන ශේෂය ගණනය කිරීම සඳහා ගෙන නොතිබුණි.

(3) ඉන්ධන මිලදී ගැනීමේ පිරිවැය වරදවා ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය වැරදි ලෙස ගණනය කර ඇත.

(4) ලාභාලාභ ගිණුම සඳහා අදාළ ඇතුළත් කිරීම් වෙළඳ ගිණුමට සටහන් කර තිබුණි.

(5) ක්ෂය ගණනය කිරීම් නිසි පරිදි සිදු කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණි.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙළ කරන්නේ කෙසේද යන්න පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නය සඳහා හොඳින් උත්තර සපයා තිබුණි.

ඇතැම් අයදුම්කරුවන් පහත සඳහන් හේතු නිසා නිවැරදිව උත්තර සැපයීමට අපොහොසත් විය:

(1) මායාට ගෙවිය යුතු සියලු මුදල් වෙන වෙනම පෙන්වා නොතිබීම.

(2) කීර්තිනාමය අදාළ ගැලපීම් නිසි පරිදි සිදු කර නොතිබූ අතර තවද, ඊට අදාළ සටහන් කිරීම් ජංගම ගිණුමේ ඇතුලත් කර තිබීම.

(3) ජංගම ගිණුම් වල ආරම්භක ශේෂයන් මාරු කර දක්වා තිබීම.

(4) ඇතැම් අයදුම්කරුවන් ජංගම ගිණුම් වෙනුවට ප්‍රාග්ධන ගිණුම්වල ගනුදෙනු සටහන් කර තිබීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

ලාභ අරමුණු කර නොගත් සංවිධානයක සාමාජිකයන්ගේ සාමාජික ගාස්තු ගිණුම සහ ආදායම් හා වියදම් ගිණුම සකස් කිරීම මෙම ප්‍රශ්නයෙන් විමසන ලදී.

නිරීක්ෂණය කරන ලද පොදු වැරදි පහත පරිදි වේ:

(1) ඇතැම් අයදුම්කරුවන් විසින් ආදායම් හා වියදම් ගිණුම නිවැරදිව සකස් කර නොතිබුණි.

(2) වර්ෂය සඳහා ක්ෂයවීම නිසි ලෙස ගණනය කර නොමැති අතර ඇතැම් අයදුම්කරුවන් විසින් එය ආදායම් හා වියදම් ගිණුමට ද ක්ෂය වීම් ගෙන නොතිබුණි.

(3) සාමාජිකයන්ගේ සාමාජික ගාස්තු ගිණුමට අදාළ හර හා බැර සටහන් කිරීම් ඇතැම් අයදුම්කරුවන් විසින් නිසි ලෙස සටහන් කර නොතිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් විසින් 2024 වර්ෂය තුළ ලබාගත් සාමාජික ගාස්තු, වර්ෂය සඳහා සාමාජික ගාස්තු ලෙස ගණන් බලා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

(a) ලබා දී ඇති තොරතුරු මත පදනම්ව **කාර්යය අංක 102** මත අය කළ යුතු මිල ගණනය කරන ලෙස විමසන ලදී. සම්පූර්ණ ලකුණු ලබා ගැනීම සඳහා නිෂ්පාදන පිරිවැය මත 25% ක් වූ සමාගමේ ලාභ ආන්තිකය අය කළ යුතු මිලට එකතු කිරීමට අයදුම්කරුවන් කිහිප දෙනෙකු අසමත් විය.

(b) ලබා දී ඇති දත්ත මත පදනම්ව, එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කිරීම දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙළ කිරීමට අවශ්‍ය වූ අතර අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිසියාකාරව උත්තර සපයා තිබුනේ නැත. තවද, ඇතැම් අයදුම්කරුවන් විසින් පොදුකාර්ය පිරිවැය විභජන පදනම නොදක්වා ඇති බව දිස් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

(a) ලබා දී ඇති දත්ත මත පදනම්ව, ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ), යළි ඇණවුම් මට්ටම සහ උපරිම තොග මට්ටම ගණනය කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කර තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය කිරීමට උත්සාහ කර නොතිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු EOQ සූත්‍රයට වැරදි ලෙස සංඛ්‍යා ආදේශ කර තිබුණි. යළි ඇණවුම් මට්ටම සඳහා අදාළ සූත්‍රය සහ උපරිම තොග මට්ටමට අදාළ සූත්‍රය සඳහා දත්ත ආදේශ කිරීමට අයදුම්කරුවන් කිහිප දෙනෙකු අසමත් වී ඇති බව නිරීක්ෂණය විය. මෙකී දුර්වලතා සඳහා යෝජනාවක් වශයෙන් අයදුම්කරුවන්ගේ ගිණුම්කරණය සහ පිරිවැය පිළිබඳ න්‍යායාත්මක දැනුම වැඩි දියුණු කර ගත යුතුය.

(b) ලබා දී ඇති දත්ත මත පදනම්ව, පළමු ලැබීම් පළමු නිකුතු කිරීම් (FIFO) ක්‍රමය යටතේ "x" අමුද්‍රව්‍ය සඳහා ගබඩා ලෙජරය පිළියෙළ කිරීම මෙම ප්‍රශ්නයෙන් විමසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා හොඳින් උත්තර සපයා තිබූ අතර FIFO ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිකුත් කරන ලද ප්‍රමාණයේ නිවැරදි මිල ලබා ගෙන නොතිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු ගබඩා ලෙජරය සකස් කිරීමට උත්සාහ නොකළ බව ද නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## C කොටස

**ප්‍රශ්න අංක 07**

මෙම ප්‍රශ්නය මගින් සීමාසහිත පුද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පරීක්ෂා කළ අතර එය **(a)** සහ **(b)** වශයෙන් කොටස් 2 කින් සමන්විත විය. **(a) කොටසින්** විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම පරීක්ෂා කළ අතර **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම පරීක්ෂා කර ඇත.

බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර තිබුණු අතර, සමහර අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි විය.

පහත දුර්වලතා නිරීක්ෂණය විය:

**(a) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම:**

(1) ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා පොදුවේ පිළිගත් ආකෘතිය අනුගමනය නොකරන ලදී.

(2) ඇතැම් අයදුම්කරුවන් විසින් ආදායම් බදු ගැලපීම නිවැරදිව සිදු කර නොතිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් විසින් යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීම සඳහා ගිණුම් තැබීම සිදු කර නොතිබූ අතර එම නිසා යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීම මත ලාභය ගිණුම්ගත කර නොතිබුණි.

(4) අයදුම්කරුවන් කිහිප දෙනෙකු විසින් විකුණුම් කොමිස් සහ අතුරු ලාභාංශ ආදායම් ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

(5) ඇතැම් අයදුම්කරුවන් විසින් වෙළඳ ලැබිය යුතු ශේෂ මත නිවැරදි ප්‍රතිපාදනයන් කිරීම සැලකිල්ලට ගෙන නොතිබුණි.

(6) ඇතැම් අයදුම්කරුවන් පෙර වැඩ ඉදිරිපත් කර නොතිබූ බැවින් ඔවුන්ට පෙර වැඩ සඳහා වෙන් කරන ලද තවත් ලකුණු කිහිපයක් ලබා ගත නොහැකි විය.

(7) ඇතැම් අයදුම්කරුවන් විසින් කාර්යාල කුලිය සඳහා ගෙවන ලද අත්තිකාරම් සැලකිල්ලට ගෙන නොතිබුණි.

**(b) මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය පිළියෙළ කිරීම:**

(1) ඇතැම් අයදුම්කරුවන් විසින් බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් අඩුකර ගෙන නොතිබුණි.

(2) ජංගම හා ජංගම නොවන වත්කම් හා වගකීම් සඳහා නිවැරදි වර්ගීකරණයන් සිදු කර නොමැත.

(3) මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා පොදුවේ පිළිගත් ආකෘතිය ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් අනුගමනය කර නොමැත.

(4) සාමාන්‍ය කොටස්හිමියන්ට කළ හිමිකම් නිකුතුව ගිණුම්වල සටහන් කිරීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් විය.

(5) යන්ත්‍ර සූත්‍ර හා මෝටර් රථ වල සමුච්චිත ක්ෂය වීම් ඇතැම් අයදුම්කරුවන් විසින් නිවැරදිව සැලකිල්ලට ගෙන නොතිබුණි.

(6) ගෙවන ලද අතුරු ලාභාංශ නිසි පරිදි ගිණුම්වල සටහන් කර නොතිබුණි.

(7) ගෙවිය යුතු විගණන ගාස්තු සහ ගෙවිය යුතු ආදායම් බදු අයදුම්කරුවන් කිහිප දෙනෙකු විසින් ගිණුම්වල දක්වා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකිවනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

- * * * -